# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2012/3 - 2017 මාර්තු මස 27 වැනි සඳුදා - 2017.03.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය.*: 6/3/7/15/13/2

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: එල්ඩී/5/2007/එම්වී/108ජී

මොරගහකන්ද / කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

මෙහි මහජන කටයුත්තක් යනු මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, නාඋල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟල පල්ලේසිය පත්තුවේ කඹරව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2013. 04. 30 වැනි දින සම්මත කරන ලද, භූලක්ෂණාත්මක මූලික පිඹුරු අංක 20, අතිරේක අංකය 102, පත්‍රය 170 දරන සැළසුමේ පෙන්නුම් කර ඇති පහත විස්තර සඳහන් ඉඩම් කොටස.

1. **කැබලි අංක 5026**

ඉඩමේ නම: මාත්මළුව *හෙවත්* ගෙදර ගාවා පැල *හෙවත්* සේරුවා කුඹුර; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: කඹරව, තලාගොඩ හංදිය ලිපිනයේ පදිංචි අංගුළුවේ ගෙදර ප්‍රශාන් මහේෂ් බණ්ඩාර මයා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1288.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 අප්‍රේල් මස 03 වැනි දින පෙ. ව. 09.00 ට නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2017 අප්‍රේල් මස 10 වන දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩී. ආර්. බී. එන්. බී. කරුණාතිලක,
ප්‍රාදේශීය ලේකම්,
නාඋල.

2017 මාර්තු මස 20 වැනි දින,
නාඋල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 220




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තරය:*

ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නෙළුව පිහිටි ගාල්ල මිනුම් අධිකාරියේ 101 දරන අවසාන පිඹුරේ (අතිරේක අංක 08) ප්‍රමාණයෙන් හෙක්. 48.9460 පමණ වූ පහත සඳහන් ඉඩම් කැබලි:

1. **කැබලි අංක 143**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: වනය සහ දෙමහල් ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; ප්‍රමාණය: හෙක්ටයාර් 40.0264.

2. **කැබලි අංක 144**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: කැළය සහ ලඳු කැළය; ප්‍රමාණය: හෙක්ටයාර් 2.0085.

3. **කැබලි අංක 145**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 1.1287.

4. **කැබලි අංක 146**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: කැළය සහ ලඳු කැළය; ප්‍රමාණය: හෙක්ටයාර් 3.4555.

5. **කැබලි අංක 147**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4462.

6. **කැබලි අංක 148**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: අවුරුදු 5 - 10 ක් පමණ වයසැති තේ වගාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1574.

7. **කැබලි අංක 149**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: ලඳු කැළය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2595.

8. **කැබලි අංක 150**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: අවුරුදු 5 - 10 ක් පමණ වයසැති තේ වගාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1028.

9. **කැබලි අංක 151**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1772.

10. **කැබලි අංක 152**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.2955.

11. **කැබලි අංක 153**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5326.

12. **කැබලි අංක 154**
ඉඩමේ නම: කිරිවානකැටියේ හේන; විස්තරය: කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3557.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 මැයි 24 වැනි දින පෙ. ව. 10.00 ට නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2017 මැයි 12 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වාභාවයත්, එකී ඉඩම්/පරවශ්‍යතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සී. බී. කේ. ජානක ගුරුසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නෙළුව.

2017 මාර්තු මස 15 වැනි දින,
නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 221

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.